# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2018 අංක 31 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 සැප්තැම්බර් මස 28 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 සැප්තැම්බර් මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2018 අංක 31 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 සැප්තැම්බර් මස 28 වන දින]

එල්.ඩී.—ඕ. 7/2018

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ සාමාජිකයන් විසින් එහි නාමය සංශෝධනය කිරීම පිණිස යෝජනා සම්මතයක් සම්මත කර ගෙන ඇති හෙයින් ද: පූර්විකාව.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය විසින් එකී යෝජනා සම්මතය බලාත්මක කිරීම සඳහා එහි නාමය සංශෝධනය කිරීමට ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීමට ඉඩදීම සුදුසු වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2018 අංක 31 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත එහි "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන පනත හා ලිඛිත නීති යනාදිය සංශෝධනය කිරීම.

(2) යම් ලිඛිත නීතියක "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන වෙනුවට "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(3) යම් දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" සම්බන්ධයෙන් ඇති සෑම යෙදුමක් ම "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" සම්බන්ධයෙන් කරන ලද යෙදුමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර කරන ලද ක්‍රියාවල වලංගුභාවය.

**3.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම ප්‍රධාන ප්‍රඥප්තියෙන් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක්, කරන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සියලු කාර්යය සඳහා, වලංගු ලෙස ක්‍රියාත්මක කරන ලද සේ සහ කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.